# 4 ශ්‍රේණිය සිංහල ගුරු අත් පොතට වැඩ පොත - අංක 13

## L10, S10, R10, W10

## නිපුණතා ආවරණය - 2021



- ලිඛිත භාෂාවෙන් ලියවුණු ලේඛන කියවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- වර්තමාන හා අතීත කාල වාක්‍යවල යෙදීම පැහැදිලි කරයි.
- ලිඛිත ව්‍යවහාරය පිළිබඳ අවබෝධයෙන් යුතු ව, නිවැරදි ව භාෂා අභ්‍යාසයේ යෙදෙයි.
- ලේඛන ව්‍යවහාරයට අනුව ලිවීමේ කුසලතාව වර්ධනය කර ගනියි.
- අක්ෂර වින්‍යාසයේ නිවැරදි භාවිතය වර්ධනය කර ගනියි.


**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**For Online Class details WhatsApp 071-9020298**

# 4 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_{10}$ $S_{10}$ $R_{10}$ $W_{10}$ ඉගෙනුම් පල

- ලිඛිත භාෂාවෙන් ලියවුණු ලේඛන කියවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- වර්තමාන හා අතීත කාල වාක්‍යවල යෙදීම පැහැදිලි කරයි.
- ලිඛිත ව්‍යවහාරය පිළිබඳ අවබෝධයෙන් යුතු ව, නිවැරදි ව භාෂා අභ්‍යාසයේ යෙදෙයි.
- ලේඛන ව්‍යවහාරයට අනුව ලිවීමේ කුසලතාව වර්ධනය කර ගනියි.
- අක්ෂර වින්‍යාසයේ නිවැරදි භාවිතය වර්ධනය කර ගනියි.

## ලිඛිත භාෂාවෙන් ලියවුණු ලේඛන කියවීම

- පහත සඳහන් උද්ධෘත, සිසුන්ට තනි තනි ව ශබ්ද නගා කියවන්න. කියවීමේ දී නිවැරදි ව උච්චාරණය කරන්නේ දැයි අනෙක් සිසුන් නිරීක්ෂණය කරන්න. (මෙම නිපුණතාවයේ ඉගෙනුම් පල සාධනයට යොදා ඇති ක්‍රියාකාරකම් සඳහා තෝරා ගත් කෘතිවලින් සරල ජේද ඇතුළත් කර ඇත. එනමුත් එම කෘති හතර වන ශ්‍රේණිය සඳහා නිර්දිෂ්ට කෘති නොවන බව අවධානයට ගත යුතු ය.)

1. චිත්‍ර ඇඳීම හැරෙන්නට දැන් මාලිට තවත් රාජකාරියක් ඇත. ඒ උදෙන් ම අවදි වී ගස් අතරින් පැන ගෙන ලේනා එන තුරු බලා හිඳ ඌට කිරි පෙඟවූ පාන් කැවීම යි. ඉඳහිට දවසක මාලිට දවල් වන තුරු නින්ද යයි. එහෙත් ලේනාගේ හඬ යන්තමින් ඇසුණු විගසින්, තම කිරි දරුවා අවදි ව හඬන විට ඇහැරෙන මවක මෙන් ඈ වහා අවදි ව එබූ දඟරයක් අත්හළ කලෙක මෙන් ඇඳෙන් පැන කුස්සියට දුවයි. **අහස පොළොව ළංවෙලා - රංජිත් ධර්මකීර්ති**

2. ටිකෙන් ටික අඳුර වැඩි වේගන එයි. ගස් මුදුන්වල මිහිරි හඬින් ගායනා කරමින් සිටි කුරුල්ලෝ ලැගුම් පළවල් සොයා යති. කැලෑවේ එක් පැත්තක සිට අනික් පැත්තට දුවන්නට එළියට පැමිණි හාවෙක් කන් දෙක උඩ හිඳුවා ගෙන වහා ගමන් ගත් කුමාරයන් දෙදෙනා දෙස බලා සිටියි. කුමාරයන් දෙන්නා බලන්නටත් පෙර හාවා ආපසු කැලයට පැන දුවයි. . .
**දඩු මොනරය - මාර්ටින් වික්‍රමසිංහ**

3. කටින් අල්ලා ගෙන සිටි පාන් කැබෙල්ලේ වූ කිරි රස ලේනාගේ දිවට දැනී ඇත. ඌ වරෙක පාන් කැබෙල්ල දෙස කෙළින් ම බලමින්, එහි රසය විඳ ගනී. කෑදර ලෙස එක වර ගිල දමනවා වෙනුවට ඌ මඳ වේලාවක් නාද කරමින් සතුට පළ කරයි. නැවතීමකින් තොර ව සොලවන උගේ උඳුපියල්ලක් තරම් වූ මුවපොඩිය ළං කරමින් පාන් කැබෙල්ල ටිකෙන් ටික කටින් කඩා ගෙන කයි. **අහස පොළොව ළං වෙලා - රංජිත් ධර්මකීර්ති**

4. . . . . පෙරහැර ගමන් කරන දින ද වේලාව ද දක්වා අතින් ලියන ලද දැන්වීම් කොළ මහපාර දෙපැත්තේ පොල් ගස්වල කල් ඇති ව අලවා තැබීමෙන් ද, අණ බෙරයෙන් ද දැනවෙන බැවින් ගම්බද ධනවත් පවුල්වල දැරියෝ ද දිළිඳු පවුල්වල දැරියෝ ද අලුත් රෙදි ගෙන්වා ගෙන එයින් ඇඳුම් මසා ගනිති. මසුරන්ගේ දැරියෝ පරණ රෙදි හැට්ට සෝදවා මද්දා ගනිති. ස්වර්ණාභරණ නැති දිළිඳු පවුල්වල දැරියෝ තම මව්පියන් ලවා හෝ සහෝදරයන් ලවා හෝ ඈත ගමක නෑයන්ගෙන් කුරු, කරාබු, ඇටවැල් ආදිය ගෙන්වා ගෙන පෙරහැර බලන්ට යන දවසෙහි තම රූ සපුව ද ඇඳුම් ද පැළඳුම් ද දැක්වීමට කල් ඇති ව සූදානම් වෙති.
**අපේ ගම-මාර්ටින් වික්‍රමසිංහ**

5. අනතුරු ව ලේන් පැටියා ආපසු කූඩුවේ තැන්පත් කළ ඔහු මෝටර් රථය පණ ගන්වා හෙවණක් ඇති ගසක් සොයා පදවා ගෙන ගොස් ඒ යට නැවැත්වීය. එහෙත් රත් වූ තහඩුව නිවෙන්නට තව බොහෝ වේලාවක් ගත වනු ඇත. පැටවු කීස් කීස් ගාමින් නද දෙති.
**අහස පොළොව ළංවෙලා-රංජිත් ධර්මකීර්ති**

6. රුවන් ද අළු ගොඩට මඳ වේලාවක් අල්ල තබා ගෙන සිටියේ ය. හරි නේද මගේ සොයා ගැනීම ? අජිත් රුවන්ගේ පිටට වැරෙන් පහරක් තට්ටු කලේය.අන්න අන්න කටහ'ක් ඇහුණා වගේ. අජිත් විස්මය පළ කොට මිදුලට කන් දුන්නේය. රුවන් ද පිටතට කන් යොමු කළේ කල්පනාවෙනි. ඔව්, ඔව් කවුද මිනිස්සු වගයක් කතා කරන හඬ තමයි රුවන් උත්තර දුන්නේ ය . . . **තුන් යහළු වික්‍රමය - කුලසේන ෆොන්සේකා**

7. නිමල්ට පාන් පෙත්තක් දෙන්නට සුනිල් බොහෝ පෙරැත්ත කළේය. අන්තිමේ දී නිමල් එය පිළිගත්තේ ය. නමුත් ඉන්පසු කීප දවසක් ම දවල් කෑම වේලාවේ නිමල් වැසිකිළියට ගොස් සැඟවී සිට සෙල්ලම් පිට්ටනිය දිගේ පාරට විත් ආපසු පන්ති කාමරයට ආවේ ය . . . .

**අඹ යහළුවෝ - ටී.බී.ඉලංගරත්න**

8. මැහැල්ල නැව් නැගී මුවන්තිස්ස කුමාරයාගේ රටට ගොස් රන්කෙඳි කුමාරිකාව සමඟ යහළු වූවා ය. කුමාරයාගේ මාලිගාවේ වාසය කරමින් ඈ වඩ වඩාත් කුමාරියගේ සිත් බැඳගත්තා ය. කුමරිය ද මැහැල්ලට සත්කාර කළේ මවකට මෙනි. දවසක් දා මැහැල්ල කුමරිය සමඟ අතික් දේ ගැන කතා කරමින් සිට හදිස්සියේ මෙසේ ඇසුවා ය . . .

**රන්කෙඳි කුමාරිකාව - මාර්ටින් වික්‍රමසිංහ**

9. ඉන්පසු දිනක ද ලේන් හාමි කාමරයට ඇතුළු වී පෙර දවසේ මෙන් ම කාමරය පරීක්ෂා කරමින් හැසිරුණා ය. ඌගේ ශබ්දය ඇසී කාමරයට ආ මාලි ඌට කතා කළ නමුත් කැස් කැස් ගාමින් කිසියම් බරපතළ රාජකාරියක නියැළුණු අයකු ලෙස හැසිරුණා පමණි. පෙර දිනට වඩා තවත් පියවරක් ඉදිරියට තබමින් ලේන් හාමි අල්මාරියෙන් මේසය මතට පැන එහි සිට වටපිට හැරී බැලුවාය. ඊළඟට ඌ තම ඇඳ මතට පතිනු නිසැක යැයි සිතූ මාලි දෑත් දිගු කර ගෙන බලා සිටියා ය. . . . **අහස පොළොව ළං වෙලා - රංජිත් ධර්මකීර්ති**

10. . . . එහෙනං මං තරහයි. ආච්චි අම්මා කතාවක් කියන්න ම ඕනෙ යි මාලි සුරතල් වූවාය. එහෙනං ඉන්නකෝ ටිකක් මතක් කර ගන්නකං යි කී මිත්තණිය එක් අතකින් මාලිගේ හිස පිරිමදිමින් හිස ඇලකොට දෑස් පියාගෙන මඳ වේලාවක් කල්පනාවේ ගැලී සිටියා ය. පැත්තකට ඇල වී කණ්ඩියෙන් පහතට බුලත් කෙළ පහරක් ගැසූ ඕ දණ හිස තෙක් හිස පහත් කොට කිමෝනාවේ කෙළවරකින් කට පිසදා ගත්තා ය. . . .

**අහස පොළොව ළං වෙලා - රංජිත් ධර්මකීර්ති**

11. එදා සුනිල් ගැමුණු විද්‍යාලයට යන අවසාන දවස ය. වෙනදා මෙන් ඔහු පන්තියේ වැඩ කළේ ය. නමුත් ඔහුගේ හැ!ගීම කුමක් දෝයි ඔහුට ම තේරුම් ගත නොහැකි විය. ගැමුණු විද්‍යාලය හැර යන්නට ඔහු කනගාටු වූයේ ය. එහෙත් අලුත් විද්‍යාලයට යාම ගැන ඔහු සන්තෝෂ විය. නුවර පදිංචිය ද ඔහු ප්‍රිය කළේ ය . . . **අඹ යහළුවෝ - ටී.බී.ඉලංගරත්න**

12. එවර ඌ අත්ත දිගේ ටිකෙන් ටික රූට රූටා ආවේ පෙර ආ ගමනේ වේගය මඳක් වැඩි කරමිනි. ඇගේ අතට ඉතා ළං වූ පසු එක් වර ම අත්ත දිගේ එහි කෙළවරට ම දුවගෙන ආ ලේනා, දියණි අතේ වූ පාන් කැබැල්ල කටින් ඩැහැ ගත්තේ ය. අනතුරු ව හිස මඳක් උඩට ඔසවා ගෙන අහංකාර ලීලාවෙන් ආපසු එම අත්ත දිගේ ම ගස මුදුනට දුව ගියේ ය . . .

**අහස පොළොව ළං වෙලා - රංජිත් ධර්මකීර්ති**

13. වෙදකමට ප්‍රසිද්ධ වෙද මහත්තුරු මින්නේරි ගම්වල විසූහ. සර්වාංග වෙදකමට සේ ම, සර්ප වෙදකමට ද බොහෝ ප්‍රසිද්ධ වූවෝ ඒ ගම්වල විසූහ. ලෙඩකු වූ විට රෑයේ පානේ බව නොසලකා ලෙඩා වෙසෙන ගමට ගොස් වෙදකම් කිරීමට තරම් මේ දේශීය වෛද්‍යවරු කාරුණික වූහ. වෙදකම කෙරුණේ හුදෙක් ම පින් සලකාගෙනය. වෙදකම සඳහා සතයකුදු අය නොකිරීමට වෙද මහත්වරු පුරුදු ව සිටියෝ ය. **සාර කෙත - පියසේන කහඳගමගේ**

14.

1948.05.16 වැනි දින,
වැල්ලම්පිටියේ,
සේදවත්තේ දී ය.

තෙරුවන් සරණ යි !

ආදරණීය මල්ලී වෙත ලියා දන්වන වග යි,

පසුගිය සිංහල අවුරුද්දට ඇවිත් ගියාට පසු මල්ලිගෙන් ලියුමක් නොලැබීම ගැන කනගාටු වෙමි. මල්ලිට රාජකාරී වැඩ නිසා ලියුමක් ලියන්න තරම් විවේකයක් නැතැ යි කියා අපි සිතන්නෙමු.

මෙයට
ආදරණීය අයියා,
ජයවර්ධන

**සාරකෙත - පියසේන කහඳගමගේ**

15. හැම විට මට දයාවෙන් හා කරුණාවෙන් සැලකූ මේ පාසලේ, තලතුනා වියෙහි වූ ප්‍රධානාචාර්යතුමා කුඩා කල ම, මගේ සිත් පහන් කළ වැඩිහිටියන් තුන් හතර දෙනාගෙන් එක්කෙනෙකි. එතුමා මට විශේෂ ආදරයක් දැක් වූයේ, මා උගැන්මෙහි සමත් කීකරු දරුවකු වූ නිසා ම නොවේ. මා කිසි කලක බොරු නොකියන්නෙකැ යි යන හැඟීමක් ද ඔහු තුළ වූ බැවිනි. ඒ වග දැන සිටි මම, දඬුවම් ලැබිය යුතු වරදක් කළ විට වුව ද ඇත්ත සඟවාගෙන බොරු කීමට නොසිතුවෙමි. එහෙත් දඬුවම් ලැබීමට මා තුළ හටගත් භය නොව ලජ්ජාව නිසා වරක් මම එතුමාට බොරුවක් කීවෙමි. බොරුවක් කීමෙන් මා දුවමින් බේරුණු නමුදු, වරද කිරීමට මා පෙලඹ වූ අනෙක් ළමයින් දෙදෙනා වේවැල් පාර කනු දුටු මා තුළ හටගත් වේදනාවත්, ලජ්ජාවත් මහත් වූයෙන්, මම එවේලේ ම හ'න්නට වීමි. නුඹ හඬන්නේ කුමක් නිසා ද යි ගුරුතුමා දෙතුන් වරක් විචාළ විට මම ඇත්ත හෙළි කළෙමි.

**අපේ ගම - මාර්ටින් වික්‍රමසිංහ**

16. මම කෑම කාමරයේ සේප්පුව ඇරියෙමි. එහි විස්කෝතු පෙට්ටි, කේක්, කෙසෙල් ගෙඩි ආදිය තිබුණි. එය වැසුවෙමි. මම අයිස් පෙට්ටිය ඇර බැලූවෙමි. පුඩිමක් හා මුදවාපු කිරි හට්ටි දෙකක් ද එහි විය. එය ද වැසුවෙමි. මම එළියට ගියෙමි. යන්තම් අඳුර වැටිගෙන එන බව දුටිමි. කපුටු රැළක් අහසේ කුඩු කරා යනු දැක්කෙමි. මම ආපසු කෑම කාමරයට ගොස් සේප්පුව ඇර කේක් ගෙඩියක් ගතිමි. එය කඩදාසි බෑගයක ලා ගෙන වත්ත මැදින් ගොස් තාප්පයට නැංගෙමි. **ඉලංගරත්න ළමා කතා - ටී.බී. ඉලංගරත්න**

17. සුනිල් හා නිමල් ගල්වළ දෙසට පා තැබුවෝ ය. යාළුවෝ දෙදෙන ඇලෙන් එගොඩ වූවෝය. එහෙත් ඔවුහු වැඩි කතාවක් නොකළෝ ය . . . **අඹ යහළුවෝ - ටී.බී.ඉලංගරත්න**

18. සමන්ත යමක් කියන්නේ හොඳ හැටි කල්පනා කර හිතාමතා බව මිතුරෝ දැන සිටියහ. එසේ ම ඔහු හැම දේක දී ම අනෙක් අය ද උනන්දු කරවන්නෙකි. එහෙයින් ඔහු ගැන මහත් විශ්වාසයක් මිතුරන් තුළ තිබුණි.

"අපි මොකක් හරි වෙළඳාමක් කරමු."

"නෑ පාම් එකක් දාමු."

"පොඩි ගොවිපොළක් පටන් ගත්තොත් නරක ද?"

"කැලෑ මණ්ඩියක් බදු අරගෙන රබර් හිටවමු." **ගජ යාළුවෝ - සෝමදාස ශ්‍රී අලවත්තගේ**

## නාම පද

- යම් කිසි ද්‍රව්‍යයක්, පුද්ගලයෙකු, ස්ථානයක්, සතෙකු හැඳින්වීම සඳහා නාම පද භාවිත කරයි. ඒ අනුව දී ඇති වගු සුදුසු පරිදි සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

| නාම පදය | ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|---|---|---|
| ගොවියා | √ | | | |
| කම්කරුවෝ | | | | |
| නීතිඥයා | | | | |
| මිනින්දෝරුවෝ | | | | |
| වඳුරා | | | | |
| බල්ලෝ | | | | |
| පොත | | | | |
| සමන් | | | | |

| | | | | |
|---|---|---|---|---|
| මල් පෝච්චිය | √ | | | |
| මාලනී | | | | |
| ඔරලෝසුව | | | | |
| මිනින්දෝරුවෝ | | | | |
| විදුහල්පති | | | | |
| පෙනේරය | | | | |
| හෝමාගම | | | | |
| අච්චියා | | | | |
| කොට්ටය | | | | |
| දුම්රිය පොළ | | | | |
| ගෙදර | | | | |
| පාලිකාව | | | | |
| සිරිමල් | | | | |
| පාසල | | | | |
| ඉත්තෑවා | | | | |
| වෛද්‍යවරයා | | | | |
| ගොළුබෙල්ලා | | | | |
| වෙළඳපොළ | | | | |

- පුද්ගල නාම, ද්‍රව්‍ය නාම, සත්ත්ව නාම, ස්ථාන නම යන නාම පදවලින් එක් එක් වචනය බැගින් ගෙන වාක්‍ය 10ක් ලියන්න.

- ඡේදයේ සඳහන් නාම පද තෝරා ගෙන වගුව සම්පූර්ණ කරන්න.

**<u>අපේ ගෙදර</u>**

කුකුළාගේ කුක්කු කූ හ'ත් කපුටන්ගේ කාක් කාක් නාදයත් හැම පැත්තෙන් ම ඇසෙයි. හණිකට අවදි වන අම්මා කුස්සියට යයි. වතුර කේතලය උණු වන්නට තබා ගෙදර සැම දෙනාට ම තේ සාදයි. මාත් නංගීත් නිදා සිටින කාමරය වෙතට එන අම්මා අප අවදි කරවයි.

උදෑසන ආහාරය පිළියෙල කරන අම්මාට අත්තම්මාගේ උදවුව ද ලැබෙයි. මුහුණකට සෝදා පාසල වෙත යාමට අප සූදානම් වන්නේ තාත්තාගේ උදවු ඇතිව ය.

උදෑසන ම මිදුලට යන අත්තම්මා මිදුල අතුගායි. මල් පැළවලට වතුර දමයි. බට්ටිච්චන්ගේ කිචි බිචි නාදයත්, ලේනුන්ගේ ටිං ටිං නාදයත් නිසා බල්ලාත් පූසාත් ඒ මේ අත දුවති.

පෙ.ව.**6.30** පමණ වන විට අප තාත්තා සමග බස් නැවතුම වෙත යා යුතුය. අත්තම්මාට ද අම්මාට හා තාත්තාට වැඳ අපි පොත් බෑගය ගෙන නිවසින් පිටත් වුණෙමු. අප දෙදෙනා පාසල වෙත යවා තාත්තා කොළඹ වැඩපළට යාම සඳහා ඊළඟ බසයට ගොඩ වෙයි.

උදේ කාලයේ ආලින්දයේ පුටුවට වී අත්තම්මා බලා සිටින්නේ ඕස්ට්‍රේලියාවේ සිටින නැන්දාගෙන් ලියුමක් බලාපොරොත්තුවෙනි. ලියුම් මාමාගේ බයිසිකලයේ ට්‍රිං ට්‍රිං නාදය ඇසෙත් ම අත්තම්මා ගේට්ටුව ළඟට යයි.

අම්මා අප එන තුරු ගෙදර දොර වැඩ කටයුතු අවසන් කර පත්තරය බලයි. පාසල නිම වී ගෙදර එන අපි දහවල් කෑම ගෙන ආලින්දයේ සිට අත්තම්මාගෙන් කතන්දරයක් අසා ගත්තෙමු.

| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

## ප්‍රාණවාචී සහ අප්‍රාණවාචී නාම පද

- පණ ඇති නාම පද ප්‍රාණවාචී නාම පද ලෙසත් පණ ඇති නාම පද අප්‍රාණවාචී නාම පද ලෙසත් හඳුන්වයි. ඡේද වල සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගු සම්පූර්ණ කරන්න.

අපි අගෝස්තු නිවාඩුවට යාල වනෝද්‍යානයට ගියෙමු. ඒ ගමනට මාත්, අම්මාත්, තාත්තාත් සහභාගි වූ අතර, ලොකු අම්මාත්, මහප්පාත් කාව්‍යා අක්කා සහ මිහිර මල්ලීත් සහභාගි වූහ.

අපි උදේ 9.00ට පමණ කැබ් රථයකින් යාල වනෝද්‍යානයට ඇතුළු වුණෙමු. පිල් විදහා ගෙන නටන මොනරෙකු දුටු විට මිහිර මල්ලී සතුටින් කෑගැසුවේය. පුතාලා කෑගැසුවොත් සත්තු බලන්න බැරි වේවි. ඒ නිසා නිහඬව ගමන යා යුතු බව අපට සහය වීමට පැමිණි වනෝද්‍යානය භාර ව සිටින මාමා පැවසුවේ ය.

ටික දුරක් යන විට අපි ලස්සන මුව රංචුවක් දුටුවෙමු. ගෝනා, අලියා, කොටියා, වලහා වැනි සිවුපාවුන් ද, කහකුරුල්ලා, කැඳැත්තා වැනි කුරුලු විශේෂ ද අපට දැකගත හැකි විය. දුර සිටින සතුන් බලා ගැනීමට අපි දුරදක්නයක් භාවිත කළෙමු.

අපි තේ බොන විට අම්මා සාදා ගෙන ගිය හැළප හා සව් දොදොල්වල රස බැලුවෙමු. දහවල් බත් මුල් කෙසෙල් කොළවල ඔතාගෙන ගිය නිසා කෑමවල රසය වැඩි බවක් හැඟුණි.

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

නිමල්ගේ වත්තේ අඹ ගසක් තිබේ. අඹ වාරයට අඹ කන්නට ලේන්නු, කුරුල්ලෝ, වඳුරෝ පැමිණෙති. අඹ පොකුරු සිඹිමින් එහා මෙහා යන ලේන්නු දුටු නිමල් අඹ පැහිලා ඇති යැයි අනුමාන කරයි. නිමල් ඔහුගේ යහළුවා වන අමල් සමඟ කෙක්ක ගෙන අඹ කඩන්නට සැරසෙයි. එය දුටු සීයා අඹ එකතු කිරීමට කූඩය ද රැගෙන අඹ ගස යටට පැමිණෙයි. බෝතික්කා නළවමින් සිටි නිමල්ගේ නංගී, අඹ කඩනු දැක දුවගෙන එයි. කූඩයේ කහපාට වී තිබූ අඹ ගෙඩියක් ගෙන කුස්සියට දුවගොස් ආච්චි අම්මාට දෙයි. ආච්චි අම්මා පිහිය ගෙන අඹ ගෙඩිය සෝදා කපා පිඟානකට දමා නංගීට දෙයි.

ආච්චි අම්මා අඹ ගස දෙසට එමින් පුතේ, ගිරවුන්ට, ලේන්නුන්ට, කුරුල්ලන්ටත් අඹ ටිකක් ඉතුරු කරන්න යැයි කියයි. අක්කාට ගවුමක් මසමින් සිටි නිමල්ගේ අම්මා අඹ කූඩය ළඟට එන්නේ කඩදාසි මලු කිහිපයක් ද රැගෙන ය. අඹ ගසේ අඹ කැඩූ දවසට අසල්වැසියන්ට නෑදෑයන්ට අඹ වෙන් කිරීම නිමල්ගේ අම්මාගේ සිරිත ය.

අඹ කඩා අවසන් වූ පසු නිමල් ඉදල ගෙන අඹ ගස යට අතු ගා පිරිසිදු කරයි. අනතුරු ව නිමල් සහ අමල් අත් සෝදා අඹ ගෙඩි දෙකක් රැගෙන මිදුලේ වූ බංකුව මත වාඩි වූයේ අඹවල රස බැලීමේ අදහසිනි.

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

- කවියේ සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

බටිති මලිති - කුරුලු පැටවු
සැම තැන - ඉගිලී
ජම්බු ගසේ - ඉදුණු ජම්බු
සොය සොයා - කතී

ලේන් පැටවු - ටිං ටිං ගා
එහෙ මෙහෙ - දුවතී
පේර ගසේ - ඉදුණු පේර
රස දැයි - බලතී

සමනලයෝ - රැන් රැන්
අත්තටු - සලතී
රෝස ගසේ - මල් පැණි බී
සිරිපා - වඳිතී

| නාම පදය | ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|---|
| කුරුලු පැටවු | √ | |
| ජම්බු | | |
| ලේන් පැටවු | | |
| පේර | | |
| සමනලයෝ | | |
| මල් පැණි | | |
| රෝස ගසේ | | |

- කවියේ සඳහන් පහත ප්‍රාණවාචී නාම පද සහ අප්‍රාණවාචී නාම පද යොදා වාක්‍ය සකස් කර ලියන්න. (කුරුලු පැටවු, ජම්බු ගස, සමනලයෝ, මල් පැණි, පේර)

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## <u>පුරුෂ ලිංග නාම පද හා ස්ත්‍රී ලිංග නාම පද</u>

- පළමු වන, දෙවන, සහ තුන් වන ශ්‍රේණිවල දී ඉගෙන ගත් පුරුෂ ලිංග නාම පද හා ස්ත්‍රී ලිංග නාම පද මතකයට නංවන්න. පුරුෂ ලිංග නාම පදයට අදාළ ස්ත්‍රී ලිංග නාම පදයත්, ස්ත්‍රී ලිංග නාම පදයට අදාළ පුරුෂ ලිංග නාම පදයත් ලියන්න.

1 අම්මා - . . . . . . . . . . .
2 ආච්චි - . . . . . . . . . . .
3 . . . . . . . . . . . - මල්ලි
4 . . . . . . . . . . . - කිරිල්ලී
5 . . . . . . . . . . . - දුව
6 ගිරවා - . . . . . . . . . . .
7 . . . . . . . . . . . - කිකිළි
8 . . . . . . . . . . . - ගුරුතුමිය
9 විදුහල්පතිතුමා - . . . . . . . . . . .
10 . . . . . . . . . . . - මුවදෙන
11 මිතුරා - . . . . . . . . . . .
12 සිංහයා - . . . . . . . . . . .
13 . . . . . . . . . . . - වෛද්‍යාචාරිය
14 ශිෂ්‍යයා - . . . . . . . . . . .
15 රජ - . . . . . . . . . . .

- ඡේදයේ සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

අප විදුහලේ පිපෙන කැකුළු විවිධ ප්‍රසංගය ලබන මස පැවැත්වේ. එහි දී වනගත දරුවෝ නාට්‍යය ඉදිරිපත් කිරීමට නියමිත ය.

එම නාට්‍යයෙන් කැලෑවේ සිටින සත්ත්ව පවුල් දෙකක් අතර සුහදතාව කියාපායි. මගේ යහළුවා වන මිහිර ප්‍රධාන නළුවා ලෙස ඇතාගේ චරිතය රඟපායි. මගේ යෙහෙළිය වන මිහිරි ප්‍රධාන නිළිය ලෙස ඇතින්න ගේ චරිතය රඟපායි. අනෙක් පවුලේ සාමාජිකයන් වන්නේ කොටියා සහ කොටි දෙන යි. මගේ සහෝදරයා වන තිසර කොටියාගේ චරිතයත් මගේ සහෝදරිය වන තිසරි කොටිදෙන ගේ චරිතයත් රඟපාති.

| පුරුෂ ලිංග නාම පද | ස්ත්‍රී ලිංග නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

- කවිවල සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

1. ආදර වදනින් අප සනසයි
ආච්චි ගෙදරට සිරියාවයි
කතා කියා අප සතුටු කරයි
සීයා අපහට කරුණාවයි

2. අලස නොවී උදයෙන් පිබිදෙයි
කුකුළා සුබ පතමින් හඬලයි
කිකිළිය කොක් කොක් නාදය දෙයි
පැටවුන් සමඟින් කෑම සොයයි

3. කිසිවකුටත් හිරිහැර නොකරයි
මුවා අපේ හරි අහිංසකයි
සෙනෙහස දී රැකවරණය දෙයි
මුව දෙන පැටවුන් සමඟ සිටියි

4. වංගෙඩි සේ පා තාලෙට තබමින්
ඇතා එන්නෙ හරි ආඩම්බරයෙන්
ඇතින්න පැටියව ළඟට අරන්
සෙනෙහස දෙයි සිත රැඳි සතුටින්

5. උදෑසනින් ම යි නැගිටින්නේ
කුරුල්ලා සතුටින් පියඹන්නේ
පැටවුන් අසලයි ගැවසෙන්නේ
කිරිල්ලියයි මේ නද දෙන්නේ

6. හොඳ වැඩ පමණක් කරනා
මිතුරා වෙයි ඔබ සැමදා
සැප දුක දෙකෙහි ම සිටිනා
මිතුරිය ඔබ ම යි සැමදා

| පුරුෂ ලිංග නාම පද | ස්ත්‍රී ලිංග නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

- නිවැරදි පිළිතුර තෝරා හිස්තැනෙහි ලියන්න.
(ගිරවා, කොටියා, ගිරවිය, කොටි දෙන, නළුවා, නිළිය, සහෝදරයා, දුව, සහෝදරිය, පුතා)

1. . . . . . . . . . . . . . . . . . පැටවුන් සමඟ ගස් බෙනයේ සිටියි.

2. . . . . . . . . . . . . . කැලයට පියඹා ගොස් කෑම සොයා ගෙන එයි.

3. ප්‍රධාන . . . . . . . . . . . . . ගේ චරිතය රඟ දැක්වූයේ මිහිර ය.

4. ප්‍රධාන . . . . . . . . . . . . . . ගේ චරිතය රඟ දැක්වූයේ මිහිරි ය.

5. රුස්ස ගස උඩ අත්තක . . . . . . . . . . නිදයි.

6. . . . . . . . . . . . . . . පැටියා සමඟ ගස පාමුල නිදයි.

7. මගේ . . . . . . . . . . . . වන සුරංග කවි සැදීමට දක්ෂ ය.

8. මගේ . . . . . . . . . . . වන සුරංගී ගීත ගායනයට දක්ෂ ය.

9. මිහිර . . . . . . . . . . . . . . . . චිත්‍ර තරගයට ඉදිරිපත් වෙයි.

10. මිහිරි . . . . . . . . . . . . . . . නැටුම් තරගයට ඉදිරිපත් වෙයි.

## ඒකවචන නාම පද හා බහුවචන නාම පද

- පළමු වන, දෙවන, තුන් වන සහ හතර වන ශ්‍රේණිවල දී ඉගෙන ගත් ඒකවචන හා බහුවචන නාම පද මතකයට නංවන්න. ඒකවචන නාම පදයට අදාළ බහුවචන නාම පදයත්, බහුවචන නාම පදයට අදාළ ඒකවචන නාම පදයත් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 01 ගස | - . . . . . . . . . . . . | 08 ගවයා | - . . . . . . . . . . . . |
| 02 කුරුල්ලා | - . . . . . . . . . . . . | 09 කුඹුර | - . . . . . . . . . . . . |
| 03 . . . . . . . . . . . . | - මල් | 10 . . . . . . . . . . . . | - පොත් |
| 04 . . . . . . . . . . . . | - උදලු | 11 ළමයා | - . . . . . . . . . . . . |
| 05 . . . . . . . . . . . . | - ගල් | 12 ශිෂ්‍යයා | - . . . . . . . . . . . . |
| 06 ගොවියා | - . . . . . . . . . . . . | 13 . . . . . . . . . . . . | - අපි |
| 07 . . . . . . . . . . . . | - අම්මලා | 14 . . . . . . . . . . . . | - තාත්තලා |

15 බල්ලා - . . . . . . . . . . . .

- ඡේදයේ සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

ඉද්දමල්ගොඩ විද්‍යාලයයේ සෑම වසරක ම පැවැත්වෙන ප්‍රදර්ශනය මෙවර ද උත්කර්ෂවත් අයුරින් එම විද්‍යාලයේ දී පැවැත්විණි. අප විද්‍යාලයයේ හතර වන සහ පස් වන ශ්‍රේණිවල සිසුහු ද එම ප්‍රදර්ශනය නැරඹීමට ගියහ. ප්‍රදර්ශනය ආරම්භ වන තුරු අපි පිට්ටනියට ගොස් පේළියට සිට ගතිමු. වෙනත් පාසල්වලින් පැමිණි සිසුන් ද පිට්ටනියේ පේළි සැදී සිටිනු අපි දුටුවෙමු.

ස්වල්ප වේලාවකින් ප්‍රදර්ශනය ආරම්භ විය. පේළියේ මුලට ම සිටි පාසලේ සිසු කණ්ඩායමට අංක 01 කුටියට ඇතුළු වීමට අවසර ලැබුණි. සෙසු කණ්ඩායම්වලට පේළි අනුපිළිවෙළින් අනෙක් කුටි කරා යාමට සංවිධායක මණ්ඩලයෙන් උපදෙස් ලැබුණි.

අපේ පන්තිය භාර ගුරුවරයා අප සමඟ ද, අප පාසලෙන් ගිය අනෙක් ගුරුවරු තමතමන්ගේ පන්තිවල සිසුන් සමඟ ද ප්‍රදර්ශනය බැලීමට ගියහ.

මෙහි පොත්පත් හා සඟරා ප්‍රදර්ශනය සඳහා ද කුටියක් වෙන් කර තිබුණි. එම කුටිය නැරඹීමට අප තුළ වූයේ ඉමහත් ආශාවකි. මා කැමති ම ලේඛකයා වූයේ මාර්ටින් වික්‍රමසිංහ මහතා ය. "ලෝක පූජිත ලේඛකයෝ" නම් පොත ද එහි දී අපට දැකගත හැකි විය.

අපේ රට ඇතුළු ආසියාතික රටවල් පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රදර්ශන කුටිය අප කාගේත් සිත් ගත් ප්‍රදර්ශන කුටිය විය.

මෙම ප්‍රදර්ශනය අධ්‍යාපනික මට්ටමෙන් ඉතා ඉහළ තත්ත්වයක පැවතුණු බව අප සෑම දෙනාගේ ම අදහස විය.

| ඒකවචන නාම පද | බහුවචන නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

නැගෙනහිර අහසේ හිරු පායා ගෙන එන්නේ තවත් අලුත් දවසක් උදා කරමිනි. අද පාසල් නිවාඩු දිනයකි. මම උදෑසන ම පිබිදී මිදුලට ආවෙමි. වතුසුදු ගස මලින් පිරී ඇත්තේ සුදුමල් වට්ටියක් ලෙසිනි. කඩුපුල් ගසේ ර්යේ රෑ පිපුණු මල, පර වී ඇත. වෙන දා ට ආච්චි එය රාත්‍රියේ දී ම පූජා කරයි. වත්ත පහළ ගස්වල කුරුල්ලන්ගේ කිචි බිචි නාදයෙන් මු!ඵ පරිසරය ම ප්‍රබෝධවත් වෙයි.

තාත්තා උදැල්ල ගෙන කුඹුරට යාමට සූදානම් වෙයි. අම්මා ලහිලහියේ ආහාර සූදානම් කරන්නේ අද ඈයත් කුඹුරට යන නිසා ය. මගේ යහ!ඵවන්ගේ තාත්තලා ද කුඹුරු වැඩට යති. අම්මලා ද කුඹුරු වැඩට උදවුවට යති. නිවාඩු දිනයක් බැවින් මම ද කුඹුරට යන්නෙමි. එවිට මගේ යහ!ඵවෝ ද කුඹුරේ දී හමුවෙති. අම්මලා, තාත්තලා කුඹුරු වැඩ අවසන් කරන තුරු අපි සෙල්ලම් කරන්නෙමු.

මගේ තාත්තා ගොවි කණ්ඩායමේ නායකයා මෙන් කටයුතු කරයි. නායක ගොවියා උදැල්ල කර තබා ගෙන කුඹුරට බසිද්දී අනෙක් ගොවියෝ ද උදලු කර තබා ගෙන, කුඹුරුවලට බසින්නේ පේළියකට ය.

කුඹුරු කෙටීම කණ්ඩායම් ලෙස එක් ව සිදු කරන අතර නියර බැඳීම ද කණ්ඩායම සාමූහික ව සිදු කරති. අපි නියර දිගේ පේළි සැදී දුවන්නෙමු. වැඩ කරන අම්මලා, තාත්තලා වෙහෙස මහන්සි නිවා ගන්නටත්, ආහාර ගන්නටත් රැස් වන්නේ ගොඩපර ගස් සෙවණට ය. එකිනෙකා ගෙනෙන ලද ආහාර බෙදා හදාගෙන කෑමට හැකි වන නිසා අපි ද ර්ට කැමැත්තක් දක්වමු. අව් රස්නය නිසා ලේන්නු, කුරුල්ලෝ ගොඩපර ගස්වලට වී සිටිති.

| ඒකවචන නාම පද | බහුවචන නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

- දී ඇති නාම පදය අයත් වර්ගය ඉදිරියෙන් √ ලකුණ යොදා වගුව සම්පූර්ණ කරන්න.

| නාම පදය | ඒකවචන නාම පද | බහුවචන නාම පද | ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|---|---|---|
| පුටුව | √ | | | √ |
| පැන් | | | | |
| කරත්තය | | | | |

| | | | | |
|---|---|---|---|---|
| ගුරුවරයා | √ | | | √ |
| පොත් | | | | |
| වෛද්‍යවරු | | | | |
| මල | | | | |
| පැන | | | | |
| තාත්තා | | | | |
| වෛද්‍යවරයා | | | | |
| පුටු | | | | |
| පොත | | | | |
| මල් | | | | |
| කරත්ත | | | | |
| තාත්තලා | | | | |
| ගුරුවරු | | | | |
| ශිෂ්‍යයා | | | | |
| පාසල | | | | |
| පූසා | | | | |
| උදලු | | | | |
| දුව | | | | |
| කම්කරුවෝ | | | | |
| පාසල් | | | | |
| මේස | | | | |
| නගරය | | | | |
| පූතා | | | | |
| සරම | | | | |
| ශිෂ්‍යයෝ | | | | |
| උදැල්ල | | | | |

- පහත සඳහන් ඒකවචන හා බහුවචන නාම පද යොදා වාක්‍ය ලියන්න.
  (පොත, පොත්, ළමයා, ළමයි, ශිෂ්‍යයා, ශිෂ්‍යයෝ, මල, මල්, උදැල්ල, උදලු)

උදා : - ළමයා සෙල්ලම් කරයි.
ළමයි සෙල්ලම් කරති.